1st Place Winner
National Productivity
Award 2020

ISO 9001 SLSI SYSTEM CERTIFIED

SLAB ACCREDITED
ISO/IEC 17021
QMS-001-01

# ප්‍රධාන ලේකම් කාර්යාලය - දකුණු පළාත
# பிரதான செயலாளர் அலுவலகம் – தென் மாகாணம்
# CHIEF SECRETARIAT - SOUTHERN PROVINCE

| මගේ අංකය / எனது இல. / My Ref. | CSS/03/13/CIR.COM.(2) | ඔබේ අංකය / உமது இல / Your Ref. | | දිනය / திகதி / Date | 2024.12. 31 |
|---|---|---|---|---|---|

ලේකම්,
ප්‍රධාන අමාත්‍යාංශය,
දකුණු පළාත.

**පළාත් සභා මූල්‍ය රීති 562 ප්‍රකාර ව බාහිර චක්‍රලේඛ දකුණු පළාත් සභාවට අදාළ කර ගැනීම**
**සෞඛ්‍ය අමාත්‍යාංශ පොදු චක්‍රලේඛ ලිපි අංක. 02-56/2022**
**සෞඛ්‍ය අමාත්‍යාංශ ලේකම්ගේ ලිපි අංක. TA/09/PHA/16/2017**

උක්ත කරුණ සම්බන්ධයෙන් මා ඇමතූ දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම්ගේ අංක SP/PSC/05/01/30(108) හා 2024.12.28 දිනැති ලිපිය හා බැඳේ.

02. එමගින්, පහත සටහනේ දක්වා ඇති චක්‍රලේඛ දකුණු පළාත් සභාවට අදාළ කර ගැනීම සඳහා 2024.12.20 දින දකුණු පළාත් ගරු ආණ්ඩුකාරතුමන්ගේ අනුමැතිය ලැබී ඇති බව මා වෙත දැනුම් දී ඇත.

| අනු අංකය | චක්‍රලේඛය නිකුත් කළ ආයතනය | චක්‍රලේඛ අංකය | නිකුත් කළ දිනය | චක්‍රලේඛයේ ශීර්ෂය |
|---|---|---|---|---|
| 01. | සෞඛ්‍ය අමාත්‍යාංශය | පොදු චක්‍රලේඛ ලිපි අංක:- 02-56/2022 | 2022.08.18 | සෞඛ්‍ය අමාත්‍යාංශයේ අතුරු වෛද්‍ය සේවාවට අයත් (MT-04) ඖෂධ සංයෝජක තනතුර සඳහා වන බඳවා ගැනීම් පරිපාටියට නිලධාරීන් අන්තර්ග්‍රහණය කිරීම |
| 02. | සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය සේවා අමාත්‍යාංශය | ලිපි අංක:- TA/09/PHA/16/2017 | 2020.02.28 | වෛද්‍ය කර්මය සඳහා වූ පරිපූරක වෘත්තීන්ගේ සේවාවේ හා අතුරු වෛද්‍ය සේවාවේ නිලධාරීන් රා.ප.ච. 06/2026 අනුව සකස් කරන ලද නව බඳවා ගැනීම් පටිපාටියෙහි අධි ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කිරීම |

03. ඒ අනුව, උක්ත කරුණ සම්බන්ධයෙන් ඔබ යටතේ පවතින අදාළ ආයතන දැනුවත් කරන මෙන් කාරුණික ව දන්වා සිටිමි.

අනිල් වික්‍රමසේකර
නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන)
ප්‍රධාන ලේකම් වෙනුවට
දකුණු පළාත

ප්‍රධාන ලේකම් / பிரதான செயலாளர் / Chief Secretary 091 4944002 | කාර්යාලය / காரியாலயம் / Office 091 4119011, 091 2234052 | ෆැක්ස් / தொலைநகல் / Fax 091 2246299 | විද්‍යුත් තැපෑල / மின் அஞ்சல் / E-mail chiefsec1@sltnet.lk | වෙබ් අඩවිය / இணையத்தளம் / Web site www.cs.sp.gov.lk
ප්‍රධාන ලේකම් කාර්යාලය, එස්.එච්. දහනායක මාවත, ගාල්ල. Chief Secretariat, S.H. Dahanayaka Mawatha, Galle.
பிரதான செயலாளர் காரியாலயம், எஸ்.எச்.தஹநாயக மாவத்தை, காலி.

"සෞභාග්‍යමත් දකුණු පළාතක්"

දුරකථන ) 0112669192 , 0112675011
தொலைபேசி ) 0112698507 , 0112694033
Telephone ) 0112675449 , 0112675280

ෆැක්ස් ) 0112693866
பெக்ஸ் ) 0112693869
Fax ) 0112692913

විද්‍යුත් තැපෑල ) postmaster@health.gov.lk
மின்னஞ்சல் முகவரி )
e-mail )

වෙබ් අඩවිය ) www.health.gov.lk
இணைய தளம் )
website )


මගේ අංකය ) 07/A/D/06/2017 -වෙළඔI
எனது இல )
My No )

ඔබේ අංකය )
உமது இல )
Your No )

දිනය )
திகதி ) 2022.08. 18
Date )

සුවසිරිපාය
சுவசிரிபாய
SUWASIRIPAYA

සෞඛ්‍ය අමාත්‍යාංශය
சுகாதார அமைச்சு
Ministry of Health

පොදු චක්‍රලේඛ ලිපි අංක: 02-56/2022

නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්, අධ්‍යක්ෂ, වෛද්‍ය අධිකාරී ඇතුළු,
සෞඛ්‍ය අමාත්‍යාංශය යටතේ පාලනය වන සියලුම ආයතන ප්‍රධානීන් වෙත,

**සෞඛ්‍ය අමාත්‍යාංශයේ අතුරු වෛද්‍ය සේවාවට අයත් (MT – 04) ඖෂධ සංයෝජක තනතුර සඳහා වන බඳවා ගැනීම් පරිපාටියට නිලධාරීන් අන්තර්ග්‍රහණය කිරීම.**

සෞඛ්‍ය අමාත්‍යාංශයේ අතුරු වෛද්‍ය සේවයට අයත් (MT- 04) ඖෂධ සංයෝජක තනතුර සඳහා වන බඳවා ගැනීම් පරිපාටිය 2020.10.13 දිනැතිව රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කර ඇත.

02. එබැවින් අතුරු වෛද්‍ය සේවයේ ඖෂධ සංයෝජක තනතුරට අයත් නිලධාරීන් නව බඳවා ගැනීම් පරිපාටිය අනුව පහත සඳහන් පරිදි ශ්‍රේණි ක්‍රමයට අන්තර්ග්‍රහණය කළ යුතුය.

| සලකා බලනු ලබන සුදුසුකම් | අන්තර්ග්‍රහණය වන ශ්‍රේණිය |
|---|---|
| 2016.10.11 දින වන විට ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ III වන ශ්‍රේණියේ සිටි සහ බඳවා ගැනීම් පරිපාටිය ක්‍රියාත්මක වන දිනය වන විට වසර 06කට අඩු සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති නිලධාරීන් | III වන ශ්‍රේණිය |
| (අ) බඳවා ගැනීම් පරිපාටිය ක්‍රියාත්මක වන දිනය වන විට වසර 06ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති,<br>• පත්වීම ස්ථිර කර ඇති<br>• විනයානුකූල දඬුවම් ලබා නොමැති<br>• අදාළ මට්ටමේ අනෙක් රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය ලබා ඇති<br>• පළමු කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය නියමිත දිනට සමත්ව ඇති නිලධාරීන් | II වන ශ්‍රේණිය |
| (ආ) 2016.10.11 දින වන විට ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ II වන ශ්‍රේණියේ සිටි නිලධාරීන් | |

මෙම රාජ්‍ය පරිපාලන/ රාජ්‍ය සෞඛ්‍ය ... අමාත්‍යාංශ ... / 02-56/2022 පොදු චක්‍රලේඛය / අණදෙස් ලිපිය අදාළ කාල සීමාවට දින සිට
දකුණු පළාත් ... අදාළ කර ගැ... සඳහා
ගරු ආණ්ඩුකාර ...ගේ අනුමැතිය. 2024/12/20
දින ලබා දී ඇති බව සහතික කර
ආණ්ඩුකාර ලේකම් සහකාර ලේකම් ... පරිදි.
එච්.පී.පී.එස්.ඩබ්.පේරේරා
සහකාර ලේකම්
ආණ්ඩුකාර ලේකම් කාර්යාලය
දකුණු පළාත

| | |
|---|---|
| (අ) 2016.10.11 දින වන විට ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ I වන ශ්‍රේණියේ සිටි නිලධාරීන් | I වන ශ්‍රේණිය |
| (ආ) බඳවා ගැනීමේ පරිපාටිය ක්‍රියාත්මක වන දිනය වන විට II වන ශ්‍රේණියේ වසර 9කට නොඅඩු සේවා කාලයක් ද සහිතව වසර 15ක සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති,<br>• විනයානුකූල දඬුවම් ලබා නොමැති<br>• දෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය නියමිත දිනට සමත්ව ඇති නිලධාරීන් | |
| බඳවා ගැනීමේ පරිපාටිය ක්‍රියාත්මක වන දිනය වන විට I වන ශ්‍රේණියේ වසර 10කට නොඅඩු සේවා කාලයක් ද සහිතව වසර 25කට වැඩි සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති නිලධාරීන් | අධි ශ්‍රේණිය |

03. නව බඳවා ගැනීමේ පරිපාටියට අන්තර්ග්‍රහණය කිරීමත් සමඟ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් විය යුතු ආකාරය හා එමගින් නිදහස් වීමට හිමිකම ලබන ආකාරය පිළිබඳ තොරතුරු ඇමුණුම 01 මගින් දක්වා ඇත.

04. ඒ අනුව බඳවා ගැනීම් පරිපාටියට අන්තර්ග්‍රහණය කිරීම සඳහා ඖෂධ සංයෝජක තනතුරට අයත් නිලධාරීන් ඇමුණුම 02 හි සඳහන් අයදුම්පත විධිමත් පරිදි සම්පූර්ණ කර ඔබගේ නිර්දේශය සහිතව පහත සඳහන් ලිපිවල <u>සහතික කරන ලද පිටපත්</u> සමඟ "අධ්‍යක්ෂ, පරිපාලන - ආයතනික ශාඛාව, නො 26, මෙඩිහවුස් ගොඩනැගිල්ල, 4 වන මහල, ශ්‍රී සංඝරාජ මාවත, කොළඹ 10 " ලිපිනයට යොමු කිරීමට කටයුතු කරන්නේ නම් මැනවි.

I. ජාතික හැඳුනුම්පත හා උප්පැන්න සහතිකය
II. මුල් පත්වීම් ලිපිය
III. පත්වීම ස්ථිර කර ඇත්නම් පත්වීම ස්ථිර කිරීමේ ලිපිය
IV. වර්තමාන ශ්‍රේණියට උසස් කරන ලද ලිපිය
V. යාවත්කාලීන කරන ලද චර්යා සටහන
VI. නිවාඩු විස්තරය
VII. කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය හා භාෂා ප්‍රවීණතාවය ලබා ඇත්නම් එම ලිපි

05. මෙම චක්‍රලේඛයෙන් ආවරණය නොවන කරුණක් සම්බන්ධයෙන් අවසන් තීරණය සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම් සතුවන අතර, මෙම නිවේදනයේ සිංහල, දෙමළ, ඉංග්‍රීසි පාඨ අතර යම් පරස්පරතාවයක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්වෙන්නේය.

එස්.ජනක ශ්‍රී චන්ද්‍රගුප්ත,
ලේකම්,
සෞඛ්‍ය අමාත්‍යාංශය.

මෙම රාජ්‍ය පරිපාලන/ ........ සෞඛ්‍ය අමාත්‍යාංශ/
02-56/2022 ........ චක්‍රලේඛය / සඳහන්
ලිපිය ........ දින සිට
දකුණු පළාත් ...... අදාල කර ගැ...
ගරු ......... අනුමැතිය. 2024/12/20
දින ලබා දී ........ සහතික කර
ආණ්ඩුකා... ලේකම් / සහකාර ලේකම් / ........

- කරු.දැ.ගැ.ස
- කරු.දැ.ගැ.ස
- කරු.දැ.ගැ.ස

පිටපත් : 1. සියලුම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම්වරුන්
2. සියලුම පළාත් සෞඛ්‍ය ලේකම්වරුන්
3. සියලුම පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරුන්

ඇමුණුම - 01

(අ) කාර්යක්ෂමතා කඩඉම් විභාගය

| එක් එක් බඳවා ගැනීම් පරිපාටිය යටතේ අනුරූපී වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයේ විෂයයන් | |
|---|---|
| පැරණි බඳවා ගැනීම් පරිපාටිය | නව බඳවා ගැනීම් පරිපාටිය |
| (1) I වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය හා පළමු දෙපාර්තමේන්තු පරීක්ෂණය<br>➤ I වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය<br>• ආයතන සංග්‍රහය හා රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති<br>• මුදල් රෙගුලාසි<br>➤ පළමු දෙපාර්තමේන්තු පරීක්ෂණය<br>• විෂයානුබද්ධ<br>• ප්‍රායෝගික | (1) I වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය<br>• ආයතන සංග්‍රහය හා කාර්ය පටිපාටික රීති<br>• මුදල් රෙගුලාසි |
| (2) II වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය හා දෙවන දෙපාර්තමේන්තු පරීක්ෂණය<br>➤ II වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය<br>• ආයතන සංග්‍රහය<br>• මුදල් රෙගුලාසි<br>➤ දෙවන දෙපාර්තමේන්තු පරීක්ෂණය<br>• විෂයානුබද්ධ →<br>• ප්‍රායෝගික | (2) II වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය<br>• ආයතන සංග්‍රහය හා කාර්ය පටිපාටික රීති<br>• මුදල් රෙගුලාසි<br>• විෂයානුබද්ධ (ලිඛිත, වාචික, ප්‍රායෝගික) |
| (3) III වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය<br>කළමනාකරණය පිළිබඳ ත්‍රෛමාසික පුහුණු පාඨමාලාව | (3) III වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය<br>• විෂයානුබද්ධ (ව්‍යුහගත රචනා) |

(ආ) පෙර පැවති ඖෂධ සංයෝජක තනතුරට අදාළව සෞඛ්‍ය විෂයභාර අමාත්‍යාංශයෙහි ශ්‍රී ලංකා තාක්ෂණ සේවයට අයත් අධීක්ෂණ කළමනාකරණ තාක්ෂණික නොවන /තාක්ෂණික සේවා ශ්‍රේණිය සඳහා වන බඳවා ගැනීම් පරිපාටිය අනුව පළමු කාර්යක්ෂමතා කඩඉමෙහි ආයතන සංග්‍රහය හා මුදල් රෙගුලාසි යන විෂයයන් සමත් නිලධාරීන් මෙම බඳවා ගැනීම් පරිපාටිය අනුව පළමු කාර්යක්ෂමතා කඩඉමෙන් නිදහස් කරනු ලැබේ. එමෙන්ම එක් විෂයයක් පමණක් සමත් වී ඇත්නම් එම විෂයය නව බඳවා ගැනීම් පරිපාටිය අනුව සමත් සේ සලකනු ලබන අතර ඉතිරි විෂයය නව බඳවා ගැනීම් පරිපාටිය යටතේ සමත් වීමෙන් පසු පළමු කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සම්පූර්ණ කළ බවට සැලකේ.

(ඇ) නව බඳවා ගැනීමේ පරිපාටිය බලාත්මක වන දිනට පෙර පැවති ඖෂධ සංයෝජක තනතුරට අදාළව සෞඛ්‍ය විෂයභාර අමාත්‍යාංශයෙහි ශ්‍රී ලංකා තාක්ෂණ සේවයට අයත් අධීක්ෂණ කළමනාකරණ තාක්ෂණික නොවන /තාක්ෂණික සේවා ශ්‍රේණිය සඳහා වන බඳවා ගැනීම් පරිපාටියෙහි සඳහන් විධිවිධාන යටතේ දෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයෙන් සමත් විය යුතු නිලධාරීන්, පැවති බඳවා ගැනීම් පරිපාටියට අනුව දෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයේ එක් එක් විෂයයන්ට අනුරූප වන නව බඳවා ගැනීම් පරිපාටිය යටතේ පැවැත්වෙන දෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයේ විෂයයන් සමත් වීමෙන් දෙවන කාර්යක්ෂමතා කඩඉම් සම්පූර්ණ කළ යුතුය. අනුරූප විෂයයන් ඉහත වගුවේ දැක්වේ.

එච්.ඩී.ඩී.එස්.ඩබ්.පෙරේරා
සහකාර ලේකම්
ආණ්ඩුකාර ලේකම් කාර්යාලය
දකුණු පළාත

..................... චක්‍රලේඛය / දැන්වීම්
ලිපිය ..................... දින සිට
දකුණු පළාත් ..................... 
..................... අනුමැතිය 2024/12/20
..................... ලබා දී .....................
ආණ්ඩුකාර ලේකම් ..................... සහකාර .....................

පැරණි බඳවා ගැනීම් පරිපාටිය අනුව දෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයෙන් අනුරූපී විෂයන් සමත් වී ඇත්නම් එම විෂයයන් පමණක් නව බඳවා ගැනීම් පරිපාටිය යටතේ සමත්වීමේ අවශ්‍යතාවයෙන් නිදහස් කරනු ලැබේ.

එමෙන්ම පෙර පැවති බඳවා ගැනීම් පරිපාටිය අනුව දෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය පූර්ණ වශයෙන් සමත් නිලධාරීන් නව බඳවා ගැනීම් පරිපාටිය අනුව සමත් විය යුතු දෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයෙන් නිදහස් කරනු ලැබේ.

(ඇ) නව බඳවා ගැනීම් පරිපාටිය බලාත්මක වන දිනට I වන ශ්‍රේණියේ වසර 05ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති නිලධාරීන් සඳහා තුන් වන කාර්යක්ෂමතා කඩඉම සමත්වීමේ අවශ්‍යතාවයෙන් නිදහස් කරනු ලැබේ. එමෙන්ම පෙර පැවති ශ්‍රේණි සංයෝජක තනතුරට අදාළ ශ්‍රී ලංකා තාක්ෂණ සේවයට අයත් අධීක්ෂණ කළමනාකරණ තාක්ෂණික නොවන /තාක්ෂණික සේවා ගණය සඳහා වන බඳවා ගැනීම් පරිපාටිය අනුව සහ අංක 1930/12 හා 2015.09.01 දිනැති ගැසට් පත්‍රයෙහි පළ කරන ලද ශ්‍රී ලංකා තාක්ෂණ සේවා ව්‍යවස්ථාව අනුව තෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය ලෙසින් වන කළමනාකරණය පිළිබඳ ත්‍රෛමාසික පුහුණු පාඨමාලාව සම්පූර්ණ කරන ලද නිලධාරීන්, නව බඳවා ගැනීම් පරිපාටිය අනුව සමත් විය යුතු තෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයෙන් නිදහස් කරනු ලැබේ.

(ඉ) කෙසේ වෙතත් අදාළ පරිදි සමත් විය යුතු කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය වෙනස් වුවද, සමත් විය යුතුව තිබූ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයට අදාළ කාලසීමාව වෙනස් නොවේ.

මෙම ~~රාජ්‍ය පරිපාලන~~/රාජ්‍ය සේවා කොමිෂන් සභා
02-56/2022 චක්‍රලේඛය / උපදෙස්
ලිපිය අදාළ කාල සීමාවේ දින සිට
ක්‍රියාත්මක [illegible] අදාළ කර ගැනීම සඳහා
ගරු අමාත්‍ය [illegible] අනුමැතිය 2024/12/20
දින ලබා දී ඇති බව සහතික කරමි.
...........................................
ආණ්ඩුකාර ලේකම් / සහකාර ලේකම් [illegible]

86

ඇමුණුම - 02

<u>සෞඛ්‍ය අමාත්‍යාංශයේ අතුරු වෛද්‍ය සේවාවට අයත් ( MT - 04 ) ඖෂධ සංයෝජක තනතුර සඳහා වන බඳවා ගැනීමේ පරිපාටියට නිලධාරීන් අන්තර්ග්‍රහණය කිරීම</u>

01. නිලධාරියාගේ සම්පූර්ණ නම : ......................................................................
......................................................................
02. නිලධාරියාගේ මුලකුරු සමඟ නම : ......................................................................
03. තනතුර : ......................................................................
04. වර්තමාන සේවා ස්ථානය : ......................................................................
05. ජාතික හැඳුනුම්පත් අංකය : ......................................................................
06. මුල්පත්වීම ලද දිනය : ......................................................................
( සහතික කරන ලද පිටපතක් අමුණන්න)
07. පත්වීම ස්ථිර කරන ලද දිනය : ......................................................................
( සහතික කරන ලද පිටපතක් අමුණන්න)
08. වර්තමාන ශ්‍රේණියට උසස් වූ දිනය : ......................................................................
( සහතික කරන ලද පිටපතක් අමුණන්න)
09. ඖෂධ සංයෝජක තනතුරේ මුළු සේවා කාලය : ......................................................................
10. සියලුම වැටුප් වර්ධක උපයාගෙන ඇති/නැති බව : ......................................................................
I. එසේ නොමැති නම් එයට හේතු : ......................................................................
......................................................................
11. කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත්/අසමත් බව :

| I වන | විෂයයන් | සමත්/අසමත් බව | II වන | විෂයයන් | සමත්/අසමත් බව | III වන | විෂයයන් | සමත්/අසමත් බව |
|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | |

12. අනෙක් රාජ්‍ය භාෂා ප්‍රවීණතාව සමත්/අසමත් බව : ......................................................................
13. විනය කටයුතු ඇති/නැති බව : ......................................................................
14. වැටුප් රහිත නිවාඩු ලබා ඇති/නැති බව : ......................................................................

ඉහත අංක 01 සිට අංක 14 දක්වා තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසයේ හැටියට නිවැරදි බව ප්‍රකාශ කරමි.

දිනය: ..............................

......................................
නිලධාරිනිය/නිලධාරියාගේ අත්සන

---

.............................. නිලධාරිනිය/නිලධාරියා විසින් අංක 01 සිට 14 දක්වා ඇති තොරතුරු පෞද්ගලික ලිපිගොනුව අනුව නිවැරදි බව මෙයින් සහතික කරමි.

දිනය: ..............................

......................................
විෂය භාර නිලධාරිනිය/නිලධාරියාගේ අත්සන

---

ආයතන ප්‍රධානියාගේ නිර්දේශය:

.................................... තනතුර දරන ..........................................මයා/මෙය/මිය අතුරු වෛද්‍ය සේවයේ MT – 04 ඖෂධ සංයෝජක නව බඳවා ගැනීම් පරිපාටියට අනුව .............................. ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කිරීම නිර්දේශ කරමි/නොකරමි.

දිනය. ..............................

......................................
ආයතන ප්‍රධානියාගේ අත්සන හා නම සහිත නිල මුද්‍රාව

මෙම රාජ්‍ය පරිපාලන/රාජ්‍ය ........................................
02-56/2022 ........................ වක්‍රලේඛය / ...........
චක්‍රලේඛය ........................
දකුණු පළාත් ........................
ගරු අණ්ඩු ........................ 2024/12/20.......
දින ලබා ........................
........................ ........................
ආණ්ඩුකාර ලේකම් / ........................

එච්.ඩී.ඩී.එස්.ඩබ්.හේරත්
සහකාර ලේකම්
ආණ්ඩුකාර ලේකම් කාර්යාලය
දකුණු පළාත

දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිර්දේශය

.........................................තනතුර දරණ..............................................................................................
................................................... මයා/මිය/මෙනවිය අතුරු වෛද්‍ය සේවයේ MT – 04 ඖෂධ සංයෝජක නව බඳවා ගැනීම් පරිපාටියට අනුව .................................. ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කිරීම නිර්දේශ කරමි/ නොකරමි.

දිනය ......................................

.......................................................
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන හා
නම සහිත නිල මුද්‍රාව

---

අමාත්‍යාංශ ලේකම් ගේ අනුමැතිය

.........................................තනතුර දරණ..............................................................................................
................................................... මයා/මිය/මෙනවිය අතුරු වෛද්‍ය සේවයේ MT – 04 ඖෂධ සංයෝජක නව බඳවා ගැනීම් පරිපාටියට අනුව .................................. ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කිරීම අනුමත කරමි/නොකරමි.

දිනය ......................................

.......................................................
අමාත්‍යාංශ ලේකම්ගේ අත්සන හා
නම සහිත නිල මුද්‍රාව

මෙම රාජ්‍ය පරිපාලන/රාජ්‍ය ....සෞඛ්‍ය අමාත්‍යාංශ
02-56/2022 .......... සෞ.ස. චක්‍රලේඛය / උපදෙස්
ලිපිය අනුව ... 2024/... දින සිට
දක්වා ... අදාළ කර ගැ ... සඳ
ගරු අමාත්‍ය ... අනුමැතිය 2024/12/20
දින ... යොමු කර
.............. ..............................
... ලේකම් / සභාපති

එච්.ඩී.ඩී.එස්.ඩබ්.හේරත්
... ලේකම්
... ලේකම් කාර්යාලය

අනුමත 30 ට 03

TA/09/PHA/16/2017

2020. 02. 25

) 0112669192 , 0112675011
) 0112698507 ; 0112694033
) 0112675449 , 0112675280

) 0112693866
) 0112693869
) 0112692913

) postmaster@health.gov.lk

) www.health.gov.lk

සුවසිරිපාය
சுவசிரிபாய
SUWASIRIPAYA

# සෞඛ්‍ය සහ දේශීය වෛද්‍ය සේවා අමාත්‍යාංශය
# சுகாதார மற்றும் சுதேச வைத்திய சேவைகள் அமைச்சு
# Ministry of Health & Indigenous Medical Services

නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් ( ශ්‍රී ලංකා ජාතික රෝහල),
ශික්ෂණ රෝහල් සහ මහ රෝහල් අධ්‍යක්ෂවරුන්,
රේඛීය අමාත්‍යාංශයට අයත් මූලික රෝහල් වල වෛද්‍ය අධිකාරීවරුන්ද ඇතුළු
සියලුම ආයතන ප්‍රධානීන් වෙත,

**වෛද්‍ය කර්මය සඳහා වූ පරිපූරක වෘත්තීන්ගේ සේවාවේ හා අතුරු වෛද්‍ය සේවාවේ නිළධාරීන් රා.ප.ච. 06/2006 අනුව සකස් කරන ලද නව බඳවා ගැනීමේ පටිපාටියෙහි අධි ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කිරීම.**

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 06/2006 ට අනුව සකස් කරන ලද වෛද්‍ය කර්මය සඳහා වූ පරිපූරක වෘත්තීන්ගේ සේවාවේ හා අතුරු වෛද්‍ය සේවාවේ නව බඳවා ගැනීම් පටිපාටිය අනුව පහත සඳහන් තනතුරු වල නිළධාරීන් අධි ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කරමින් නිකුත් කර ඇති ලිපි හා බැඳේ.

තනතුරු ලේඛනය

1. ඖෂධවේදී
2. වෘත්තීය චිකිත්සක
3. භෞතීය චිකිත්සක
4. විකිරණ ශිල්පී
5. ඛන්තු රේඛන ශිල්පී
6. විද්‍යුත් නිකර්පණ රේඛන සටහන්කරු
7. සෞඛ්‍ය කීට විද්‍යා
8. අක්ෂි තාක්ෂණවේදී
9. දන්ත කාර්මික
10. පාසල් දන්ත චිකිත්සක
11. පවුල් සෞඛ්‍ය සේවා නිළධාරි
12. මහජන සෞඛ්‍ය සේවා පරීක්ෂක
13. වෛද්‍ය රසායනාගාර කාර්මික විද්‍යාඥ

02. නව බඳවා ගැනීම් පටිපාටිය අනුව අධි ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කර ඇති නිලධාරීන්ට අදාළ වැටුප් පියවර 32 වැටුප් පියවර වේ. එහෙත් මේ වන විටත් එම වැටුප් පියවර ඉක්මවා ඇති වෛද්‍ය කර්මය සඳහා වූ පරිපූරක වෘත්තීන්ගේ සේවාවේ හා අතුරු වෛද්‍ය සේවාවේ නිළධාරීන් සඳහා ආයතන සංග්‍රහයේ VII වැනි පරිච්ඡේදයේ 4 වගන්තියේ විධිවිධාන අදාළ කර ගැනීම සම්බන්ධයෙන් ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවෙන් හා රාජ්‍ය පරිපාලන, ආපදා කළමනාකරණ සහ ග්‍රාමීය ආර්ථික කටයුතු අමාත්‍යාංශයෙන් උපදෙස් විමසන ලදී.

03. ඒ අනුව, වෛද්‍ය කර්මය සඳහා වූ පරිපූරක වෘත්තීන්ගේ සේවාවේ සහ අතුරු වෛද්‍ය සේවාවේ ඉහත සඳහන් තනතුරු වල සේවයේ නියුතු, මේ වන විටත් අධි ශ්‍රේණියට අන්තර්ග්‍රහණය වී ඇති නිළධාරීන්ගේ ලිපිවල 3 ඡේදයෙහි ඇති "මෙම අන්තර්ග්‍රහණයේ දී, ආයතන සංග්‍රහයේ VII පරිච්ඡේදයේ 4 වගන්තියේ විධි විධාන වලට යටත්ව ඔබගේ වැටුප් සංශෝධනය කරනු ලැබේ." යන වගන්තිය පමණක් පහත පරිදි සංශෝධනය වන බව කාරුණිකව දන්වා සිටිමි.

"මෙම අන්තර්ග්‍රහණයේ දී, ආයතන සංග්‍රහයේ VII වැනි පරිච්ඡේදයේ 5 වගන්තියේ විධි විධාන වලට යටත්ව ඔබගේ වැටුප් සංශෝධනය කරනු ලැබේ."

ඒ.එම්.කේ.කේ.අත්තනායක,
අතිරේක ලේකම් (පාලන) II.
සෞඛ්‍ය සහ දේශීය වෛද්‍ය සේවා අමාත්‍යාංශයේ ලේකම් වෙනුවට

ඒ. එම්. කේ. කේ. අත්තනායක
අතිරේක ලේකම් (පාලන) II
සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය
"සුවසිරිපාය"
කොළඹ 10.

පි/ප
දිනය: 2020. 02. 17.

සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය ... TA/09/PHA/16/2017 චක්‍රලේඛය / පදෙස් ... දින සිට ... ක්‍රියාත්මක කර ගැනීමට ... ගරු අණ ... ගේ අනුමැතිය 2021.12.20

ආණ්ඩුකාර ලේකම් / සහකාර ලේකම් / පරිපා.

ආණ්ඩුකාර ලේකම් කාර්යාලය
ලැබුණු සළකුණ

දුරකථන ) 0112669192 , 0112675011
தொலைபேசி ) 0112698507 , 0112694033
Telephone ) 0112675449 , 0112675280

ෆැක්ස් ) 0112693866
பெக்ஸ் ) 0112693869
Fax ) 0112692913

විද්‍යුත් තැපැල ) postmaster@health.gov.lk
மின்னஞ்சல் முகவரி )
e-mail )

වෙබ් අඩවිය ) www.health.gov.lk
இணையத்தளம் )
website )

මගේ අංකය ) MH/AE/05/COM/01/2024
எனது இல )
My No. )

ඔබේ අංකය )
உமது இல )
Your No. : )

දිනය ) 2024.09. 18
திகதி )
Date )

# සුවසිරිපාය
# சுவசிரிபாய
# SUWASIRIPAYA
# සෞඛ්‍ය අමාත්‍යාංශය
# சுகாதார அமைச்சு
# Ministry of Health

ලේකම්,
දකුණු පළාත් ප්‍රධාන අමාත්‍යාංශය,
5 වන මහල,
දක්ෂිණපාය, අමාත්‍යාංශ සංකීර්ණය,
ලබුදූව, ගාල්ල.

<u>පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිනියන්ගේ අධි ශ්‍රේණියට අන්තර්ග්‍රහනය කිරීම සහ අධි ශ්‍රේණියට උසස් කිරීම සම්බන්ධව</u>

උක්ත කරුණ සම්බන්ධයෙන් ඔබේ සමාංක හා 2024.07.29 දිනැති ලිපිය හා බැඳේ.

02. ඒ අනුව රේඛීය අමාත්‍යාංශය යටතේ රෝහල් හා ආයතනවල සේවයේ නියුතු අතුරු වෛද්‍ය සේවයේ තනතුරුවලට අදාල නිලධාරීන් අධි ශ්‍රේණියට අන්තර්ග්‍රහනය කිරීම සම්බන්ධව නිකුත් කර ඇති මගේ අංක TA/09/PHA/16/2017 හා 2020.02.28 දිනැති ලිපියේ පිටපතක් ඔබගේ දැන ගැනීම සඳහා කාරුණිකව ඔබ වෙත යොමු කරමි.

ඉෂානි කොල්ලුරේ
අධ්‍යක්ෂ (පරිපාලන - ආයතනික)

අත්.කළේ : කේ.එම්.වත්සලා ප්‍රියදර්ශනී,
අතිරේක ලේකම් (පාලන) 02